# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1415 /2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 12/11/2023<br>පැය 1130 |

## මාධ්‍ය නිවේදනය

**මාධ්‍ය මඟින් ප්‍රචාරය වූ පුවතක අසත්‍ය කරුණු කිහිපයක් නිවැරදි කර දැනුවත් කිරීම - කොට්ඨාස භාර නිලධාරි මාතර.**

කිසිදු ආහාරයක් සොයා ගැනීමට නොහැකි වූ පුද්ගලයෙකු බඩගින්න ඉවසා ගත නොහැකිව ගස්ලබු ගසකින් ගස්ලබු ගෙඩි 03 ක් කඩාගැනීමේ සිද්ධියක් සම්බන්ධයෙන් පොලිස් අත්අඩංගුවට ගෙන අධිකරණයට ඉදිරිපත් කර ඇති බවට පුවතක් පසුගියදා මාධ්‍ය මඟින් ප්‍රචාරය විය.

මේ සම්බන්ධව මාතර පොලිස් කොට්ඨාස භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා විසින් මා වෙත වාර්තාවක් යොමු කරමින් කරුණු පැහැදිලි කිරීමක් සිදුකර ඇත.

ඒ අනුව හක්මන පොලිස් වසමේ පදිංචි පුද්ගලයෙකු විසින් ඔහුගේ ඉඩමේ වගාකර තිබූ Red Lady වර්ගයේ ගස්ලබු ගෙඩි තුනක් පුංචි කොරටුව, වේපතඉර, හක්මන ලිපිනයේ පදිංචි පුද්ගලයෙකු විසින් සොරකම් කළ බවට හක්මන පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් සිදුකර ඇත. මෙම සොරකම සිදුකල පුද්ගලයා පැමිණිලිකරුගේ ඉඩම් වල භෝග සොරකම් කරන බවත්, එසේ නොකරන ලෙසට ඔහුට පැමිණිලිකරු විසින් අවස්ථා ගණනාවකදීම දැනුම් දුන්නද ඒ පිළිබඳව තැකීමක් නොකර දිගින් දිගටම මෙම ආකාරයට සොරකම් සිදු කරන බැවින් ඔහුට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කරන ලෙසට පැමිණිලිකරු විසින් ඉල්ලා සිට ඇත.

එම පැමිණිල්ල අනුව හක්මන පොලිස් ස්ථානය මඟින් මෙම සොරකම සම්බන්ධයෙන් අදාල පුද්ගලයා අත්අඩංගුවට ගෙන දෙයියන්දර ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සැකකරු රුපියල් 50,000/- ශරීර ඇප මත මුදවා හැර ඇති අතර, වැඩිදුර නඩු විභාගය 2023.11.27 වන දිනට කල්තබා ඇත.

මෙම අත්අඩංගුවට ගැනීම සම්බන්ධ පුවත මාධ්‍ය මගින් ප්‍රචාරය වූ බවත්, එසේ ප්‍රචාරය වීමේදී “දින ගණනාවක් තම දරුවන්ට කුසට කිසි ආහාරයක් දෙන්න බැරි වූ නිසා මෙම දෙය කල බවට " සැකකරු වෙනුවෙන් පෙනී සිටි නීතිඥවරිය විසින් අධිකරණයට කරුණු දැක්වූ බවට සඳහන් වූ කරුණ සහ “ හක්මන පොලිස් ස්ථානාධිපති ප්‍ර.පො.ප සනත් කුමාර

මහතාගේ උපදෙස් මත පො.සැ 925 සෝමසිරි මහතා පෙනී සිටි බවට " යනුවෙන් ප්‍රචාරය වීම සාවද්‍ය බවටත්, ඒ බව අධිකරණ කාර්ය සටහන් අනුව පෙනී යන බවත් කෙසේ වුවද මෙම සිද්ධිය සම්බන්ධයෙන් කිසිදු වාර්තාකරුවෙකු හක්මන පොලිස් ස්ථානාධිපතිවරයාගෙන් විමසා නොමැති බවටත් මාතර කොට්ඨාස භාර නිලධාරි විසින් මා වෙත වාර්තා කර ඇත.

**මෙම සොරකම සම්බන්ධයෙන් අත්අඩංගුවට ගත් සැකකරු හමුදා සේවයේ ලුතිනන්වරයෙකු ලෙස සේවය කර 2015.05.24 වන දින විශ්‍රාම ලබා මේ වන විට රුපියල් හතලිස්පන්දාහකට වැඩි විශ්‍රාම වැටුපක් ලබන පුද්ගලයෙකු බවට අනාවරණය වී ඇත. සැකකරුගේ බිරිඳ ද ඇඟළුම් ආයතනයක සේවිකාවක් ලෙස කටයුතු කරන අතර, මෙම සැකකරුට එක් දියණියක් පමණක් සිටින බවත්, ඇයද විවාහ වී වෙනම පදිංචිව සිටින බවට හා මෙම සැකකරු කිසිසේත්ම දැඩි ආර්ථික දුෂ්කරතාවයන්ට මුහුණපා ඇති අයෙකු නොවන බවටත් වැඩිදුරටත් දන්වා ඇත.**

තවද, මෙම සැකකරු 2017.02.17 වන දින සිට 2023.08.31 වන දින දක්වා වූ කාල සීමාව තුල නීති විරෝධී මත්පැන් ළඟ තබා ගැනීම සම්බන්ධයෙන් අවස්ථා 11 ක දී අත්අඩංගුවට පත්වී ඇති අතර, මුදල් ඔට්ටුවට සූදු සෙල්ලම් කිරීමේ වැරදි වලටද අත්අඩංගුවට පත්වී වරදකරු වී ඇත. ඊට අමතරව දේපල සොරකම් කිරීම්, පහරදීම්, බීමත්ව රිය පැදවීම යන වැරදි සම්බන්ධව පොලිසිය මඟින් අත්අඩංගුවට ගෙන ගරු අධිකරණයේ නඩු පවරා ඇති අතර, එම නඩු මේ වන විට විභාග වන බවත්, වරෙන්තු සඳහා අවස්ථා 3ක දී සැකකරු පොලිස් අත්අඩංගුවට පත්ව ඇති බවත් සඳහන් කර ඇත.

මෙවැනි සිදුවීම් පිළිබඳව සාවද්‍ය කරුණු මාධ්‍ය මඟින් ජන ගත කිරීම තුළින් ශ්‍රී ලංකා පොලිසිය, ගරු අධිකරණය ඇතුළු විවිධ ආයතනවලට හානි සිදුවන බැවින් මෙම නිවැරදි පුවත සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීමක් සිදු කරන ලෙස මාතර කොට්ඨාස භාර නිලධාරි විසින් මා වෙතින් ඉල්ලීමක් කර ඇත.

ඒ අනුව මෙම නිවැරදි තොරතුරු ඔබ වෙත යොමු කරමි.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.